ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka
EXTRAORDINARY
No. 2150/77 - FRIDAY, NOVEMBER 22, 2019

## රජයේ රැකියා සඳහා ගැසට් පත්‍රය සිළුමිණ සමඟ යළිත් ඔබ අතට


# සිළුමිණ
சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 92 වැනි කාණ්ඩය 04 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මකර රවි 11 භාග දුරුතු පුර එකොළොස්වක ඉරිදා ■ වර්ෂ 2021ක් වූ ජනවාරි මස 24 වැනි ඉරිදා මිල රු 80.00

## සිළුමිණ සමඟ රසඳුන හා ක්‍රීඩා අතිරේක

02
රටක් වසඟ කළ ගාල්ලේ දියණිය

03
රා මදින 'මහත්තුරු'



10
රණවිරුවන්ට 'විශ්‍රාමයෙන්' අගතියක්

16
ගෝනමස් වෙනුවට නකල්ස් මීහරක්

17
බුදුන් උපන්නේ ලංකාවේද?

25
රට හෙල්ලූ හෝකන්දර ඝාතන

# සැහැල්ලු දුම්රිය මර දශකත්

## කිලෝමීටරයක

(තාරක වික්‍රමසේකර)

ඉකුත් 'යහපාලන' රජය සමයේ යෝජනා කරන ලද සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධතිය (Light Railway Transit) අතිවිශාල මූල්‍ය දූෂණයක් හා නාස්තියක් බවත් එම මාර්ගය ඉදිකිරීමට

මාර්ග කිලෝමීටර
ලක්ෂ 26,388 ක්
සංස්කරණ,තේ ව
න්තශාලා නවීකර
රාජ්‍ය අමාත්‍ය කන

ශනය-
න් යුත්
දෙහා ඇම-
මේන්තු

ැනි පිටුවට

## විදෙස් සංචාරකයන් දසලක්ෂයකට ශ්‍රී ලංකාව අත වනයි

**කොවිඩ් 19 රෝගය හමුවේ අඩපණ වූ සංචාරක ව්‍යාපාරය යළි ස්ථාපිත කිරීම පිණිස ගුවන් තොටුපොළ යළි විවෘත කිරීමත් සමඟ සංචාරකයන් සෞඛ්‍ය නිර්දේශ අනුව මෙරටට පැමිණීමේ යහපත් ප්‍රතිචාරයක් ලැබී ඇතැයි ගුවන් සේවා සමාගම් 35ක් මෙරටට සිය ගමනාන්තයන් මෙම මස සිට ආරම්භ කරන බව දැනුම් දී ඇතැයිද සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග සිළුමිණට කීවේය.**

මේ අනුව මෙම වසර තුළ අවම වශයෙන් සංචාරකයින් දස ලක්ෂයකට අධික පිරිසක් පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවට වාර්ෂිකව පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව ලක්ෂ 20කට අධිකය. වසර 2018දී මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 23,33,796 වූ අතර එය 2019 වසරේදී 19,13,702ක් විය. ඉන් 2018 වසරේදී ඇමරිකන් ඩොලර් මිලියන 4,381ක ආදායමක් උපයා ගත් අතර වසර 2019දී උපයා ගත් මුදල ඇමරිකන් ඩොලර් මිලියන 3,610කි.

>> 2 වැනි පිටුවට

## ආශ්‍රිතයන් නැති රෝගීන් 85ක්

### රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

**ආශ්‍රිතයන් හඳුනා ගත නොහැකි කොවිඩ් 19 රොගීන් 85 දෙනකු මේ වන විට හඳුනාගෙන ඇතැයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සංස්කාරක වෛද්‍ය හරිත අලුත්ගේ පවසයි. රෝගය සමාජ ව්‍යාප්තියක් කරා ගොස් නැති බවට සෞඛ්‍ය අංශ පැවසුවද මේ තත්ත්වය මත රෝගීන්ගේ ආශ්‍රිතයන් සොයා ගැනීම පවා වඩාත් දුෂ්කර කාර්යයක් වනු ඇතැයිද ඔහු පෙන්වා දුන්නේය.**

රෝග ව්‍යාප්තිය පිළිබඳව කරුණු වාර්තා වන විට තවත් විශාල පිරිසක් කරා රෝගය ව්‍යාප්ත වී තිබෙන්නට බොහෝ ඉඩ ඇතැයි පෙන්වා දුන් ඔහු මේ තත්ත්වය මත රෝග ව්‍යාප්තිය පාලනයට කඩිනම් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවද පෙන්වා දුන්නේය.

## අධිකරණ



## එඩ්වින් ආරියදාසයන් දැයෙන් සමුගනී!

කලාකීර්ති ආචාර්ය එඩ්වින් ආරියදාසයන් ඉකුත් 22 සිකුරාදා අභාවප්‍රාප්ත වූ අතර ඔහුගේ අවසන් කටයුතු 24 ඉරිදා පස්වරුවේ බොරැල්ල පොදු සුසාන භූමියේදී සිදු කෙරේ. මිය යන විට 98 හැවිරිදි වියේ පසුවූ ආරියදාසයන් ගාල්ල උණවටුනේදී උපත ලැබුවේ 1922 වසරේ දෙසැම්බර් 3 වැනිදාය. පවුලේ බාලයා වූ ඔහුගේ දෙමාපියන් වූයේ ජී.කේ.වී.කේ ඒබ්‍රහම් අප්පුහාමි හා සිසිලියාන හාමිනේය.

දේවාතුර ඉංග්‍රීසි පාසලේ මූලික අධ්‍යාපනය ලැබූ ඔහු ද්විතියික අධ්‍යාපනය ලැබුවේ ගාල්ල මහින්ද විද්‍යාලයෙනි. අනතුරුව 1945 කොළඹ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ අතර උපාධිය සමත් වීමෙන් පසු 1949 වසරේ මාධ්‍යවේදියකු වශයෙන් ලේක්හවුස් ආයතනයේ සේවයට බැඳුණි. අනතුරුව දිනමිණ, ඩේලි නිව්ස්, සන්ඩේ ඔබ්සවර්, මෙන්ම සිළුමිණ පුවත්පතට සම්බන්ධ වී කටයුතු කළ ආරියදාසයන් වසර කිහිපයක් නවයුගය පුවත්පතේ කතුවරයාද විය. ආරියදාසයෝ සියවසකට ආසන්න සිය ජීවිත කාලය තුළ දශක 6කට අධික කාලයක් ලාංකීය සන්නිවේදන කලාව ප්‍රවර්ධනය කිරීමෙහිලා අසමසම සේවයක් ඉටු කළහ. හැටේ දශකයේ අග භාගයේ පුවත්පත් කලාව විෂයයක් වශයෙන් ලාංකීය සමාජයට හඳුන්වා දීමේ පුරෝගාමියකු වන්නේද එඩ්වින් ආරියදාසයන්ය. ඔහුගෙන් ආභාසය හා ගුරුහරුකම් ලබාගත් මාධ්‍යවේදීන් සංඛ්‍යාව දහස් ගණනකි.

'ඇවිදින පුස්තකාලය' නමින් බොහෝ දෙනා ඔහු හඳුන්වා දෙනු ලැබූ අතර අවසාන කාලයේ මාධ්‍ය උපදේශයකු වශයෙන් දෙස් විදෙස් මාධ්‍ය සහ ආයතන ගණනාවක සේවය කළ අතර සිංහල සහ ඉංග්‍රීසි බසින් සිය මාධ්‍ය කටයුතු සිදු කිරීමට ඉහළ පරිචයක් දැක්වීය. අවිවාහක දිවියක් ගත කළ ඔහුගේ ඇල්විට්ගල මාවතේ නිවස ඕනෑම අවස්ථාවක මාධ්‍ය කටයුතුවල නිරත වන අය වෙනුවෙන් විවෘතව තිබුණි. දේහය මහජන ගෞරවය සඳහා ජයරත්න මල්ශාලාවේ තැන්පත් කර ඇත. ලේක්හවුස් ආයතනය බිහි කළ විශිෂ්ට මාධ්‍යවේදියකු වූ එඩ්වින් ආරියදාසයන්ට මෙසේ ලේක්හවුස් ආයතනයේ උපහාරය පුද කරමු.

## බස්නාහිර පාසල් එකවර විවෘත නොවේ

(සුභාෂිණී ජයරත්න)

**බස්නාහිර පළාතේ අනෙකුත් ශ්‍රේණි සඳහා පාසල් ආරම්භ කිරීම එකවර සිදු නොවන බවත්, විවෘත කිරීමට සෞඛ්‍ය අනුමැතිය ලබා දෙන පාසල් අදියරෙන් අදියර විවෘත කෙරෙන බවත් අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල. සී. පෙරේරා සිළුමිණට පැවැසීය. එසේ නැවත විවෘත කරන්නේ ඒ ඒ පාසල් විවෘත කිරීමට සුදුසු වාතාවරණයක් තිබේද**

බස්නාහිර පළාත නියෝජනය වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙකුගේ නියෝජනයෙන් සැදුම් ලත් කමිටුවක් මේ සඳහා පිහිටුවා ඇති අතර, ඔවුන් විසින් ජනවාරි 28, 29,පෙබරවාරි 1 යන දිනයන් ගෙන් එක් දිනෙක රැස්වන අතර, තම ප්‍රදේශයට අයත් පාසල් අතරින් ආරම්භ කිරීමට සෞඛ්‍ය අවදානමක් නොමැති පාසල් සම්බන්ධ එකඟතාවකට එළඹීම සිදු කෙරෙන අතර, එම නිර්දේශ අධ්‍යාපන අමාත්‍යාංශය

## අන්තර්ජාල මූල්‍ය වංචා සොරුන්ගෙන් ප්‍රවේශම් වන්න

(අමිල මලවිසූරිය) >> 2 වැනි පිටුවට

## වැඩිම වී අස්වැන්න මේ වසරේ

(නිහාල් පී. අබේසිංහ)

ලබාදෙන බවයි. මෙරට කෘෂි ඉති-

## සිම්පල් මෑන්